නිපුණතාව 04 : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් නිර්මාණකරණයේ යෙදේ.

නිපුණතා මට්ටම 4.3 : විවිධ ද්‍රව්‍ය හා ශිල්ප ක්‍රම භාවිත කරමින් සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන රංග ආභරණ සකස් කරයි.

ක්‍රියාකාරකම 4.3 : සාම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය වන රංග ආභරණයක් සකස් කරමු.

ඉගෙනුම් පල :

- දේශීය සාම්ප්‍රදායික රංග ආභරණවල සුවිශේෂ ලක්ෂණ විමර්ශනය කර තොරතුරු ඉදිරිපත් කරයි.
- ඒකල ව හෝ සාමූහික ව හෝ නිර්මාණය කරන රංග ආභරණ නම් කරයි.
- රංග ආභරණ නිර්මාණය කිරීමේ ක්‍රම ශිල්ප හඳුනා ගනිමින් ඒවා භාවිතයට ගනියි.
- තෝරාගත් රංග ආභරණයක දළ රූප සටහනක් අඳියි.
- එම රංග ආභරණය සකස් කිරීමට සුදුසු අමු ද්‍රව්‍ය තෝරයි.
- විවිධ ක්‍රම ශිල්ප භාවිත කරමින් රංග ආභරණයක් නිර්මාණය කරයි.
- රංග ආභරණ සකස් කිරීමේ දී සාමූහික ව කටයුතු කරයි

ශිෂ්‍යයා කල යුතු කාර්යයන් -

- රංග ආභරණ සැකසීමේ කලාව පිළිබඳව අන්තර් ජාලය තුළින් හෝ ඒ පිළිබඳව හැකියාවක් ඇති පුද්ගලයෙකු ගෙන් අසා දැන ගන්න.
- විවිධ රංග ආභරණ වල ආකෘති වල රූප සටහන් එකතු කර ගන්න.
- එම රංග ආභරණ සැකසීමේදී යොදා ගන්නා අමු ද්‍රව්‍ය මොනවාදැයි හඳුනා ගන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි  පොත් පත් / වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක**

- 12ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල සැරසිලි කලාව - ලයනල් බෙන්තරගේ
- වේදිකා නාට්‍යයේ ආනුෂංගික අංග - ජගත් පද්මසිරි
- E තක්ෂිලාව

**ඇගයීම :**

- සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශනය වන රංග ආභරණයක් සකස් කරන්න.
- අන් අය ඉදිරිපත් කරන ලද රංග ආභරණ ඇගයීමට ලක් කරන්න.

**පහත සඳහන්  ඇගයීම් ද සිදු කරන්න.**

- සති පාසල් කායී පත්‍රිකා - 12 නර්තනය දෙවන වාරය A – 19

පසු ක්‍රියාකාරකම්

- රංග ආභරණ සැකසීමේ කලාව දිගටම ප්‍රගුණ කරන්න.සම්පත් දායක පුද්ගලයෙකුගෙන් ඒ පිළිබඳව තව දුරටත් කරුණු විමසා දැනුම වර්ධනය කර ගන්න.
- පාසලේ නර්තන අංගයක් සඳහා සාමූහිකව හෝ තනිව රංග ආභණ සාදා ඒවා පැලද නර්තනය කිරීමට සලස් වන්න.
- ස්වයං නිර්මාන ව්‍යාපාරයක් දක්වා ද මෙය සංවර්ධනයර ගත හැකිය.

**සැකසුම - එච්. අයි. නීලකාන්ති. ර/ සුමනා බාලිකා විද්‍යාලය  . රත්නපුර කලාපය .**